ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලු ම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, මහ භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, මහ භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලු ම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ භෞතික වත්කම් විකිණීමෙන් ලද වටිනාකම ලෙස රු.249,556ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ඇතුළත්කර තිබුණ ද, සත්‍ය ලෙස වත්කම් විකිණීමෙන් ලද මුදල රු.57,029කි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ භෞතික වත්කම් විකිණීමෙන් ලද මුදල් ලෙස රු.192,527ක් වැඩියෙන් දක්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් විකිණීමෙන් සත්‍ය වශයෙන් ලැබූ ආදායම රු.57,029ක් බවත්, නිවාස කුලී ආදායම රු.249,556ක් බවත්, එම ආදායම් මාරු වී අවසන් ගිණුම්වල සටහන් වී ඇති බවත් දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.
(ii)	සමාලෝචිත වර්ෂයේ ආදායම් නොවන ලැබීම් රු.50,030,954ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත්කර තිබුණ ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමට අනුව ආදායම් නොවන ලැබීම් රු.50,223,481ක් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් රු.192,527ක් අඩුවෙන් දක්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් විකිණීමෙන් සත්‍ය වශයෙන් ලැබූ ආදායම රු.57,029ක් බවත්, නිවාස කුලී ආදායම රු.249,556ක් බවත්, එම ආදායම් මාරු වී අවසන් ගිණුම්වල සටහන් වී ඇති බවත් දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.560,878,233ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත්කර තිබුණ ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.564,995,925ක් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.4,117,692ක් අඩුවෙන් දක්වා තිබුණි.	සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වල ඇතුළත් විය යුතු රු.4,117,692ක වටිනාකමක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ අවසාන ගිණුම්වල සටහන් වී ඇති බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.

(ඇ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත්කර ගැනීම සඳහා දරන ලද වියදම රු.106,965,279ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන	සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වල ඇතුළත් විය යුතු රු.4,117,692ක වටිනාකමක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.

ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව එම අගය රු.102,847,587ක් විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදීගැනීම සඳහා වැය කරන ලද මුදල රු.4,117,692ක් වැඩියෙන් දක්වා තිබුණි.	අවසාන ගිණුම්වල සටහන් වී ඇති බව දන්වා තිබුණි.	

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ පොත් අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය රු.19,545,764ක් වූ අතර, එම ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 52) අනුව රු.19,566,424කි. ඒ අනුව ආරම්භක ශේෂ අතර රු.20,660ක වෙනස වර්ෂය අවසානයේදී ද දක්නට ලැබුණි.	මෙම වෙනස 1996 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන ශේෂයක් වන අතර, එම වෙනස සොයාබලා නිවැරදි කරන ලෙස රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා එවා ඇත. නමුත් එම කාලයට අදාළ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇතත්, එම කාලයට අදාළ පොත්පත් සොයාගත නොහැකි වී ඇති බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.

(ඉ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම්වල (ACA – 6 ආකෘතිය) 2023 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම් කාණ්ඩ හතරක අවසාන ශේෂයන් සහ 2024 ජනවාරි 01 දිනට දක්වා ඇති එම වත්කම් කාණ්ඩවල ආරම්භක ශේෂයන් අතර රු.466,900,603ක වෙනසක් දක්නට ලැබුණි.	වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට පවරාගන්නා ලද වාහන 04ක වටිනාකම වූ රු.21,700,000ක්, ව්‍යාපෘතිය යටතේ ලැබුණු විද්‍යාගාර උපකරණ හා ගොඩනැගිලිවල වටිනාකම රු.42,836,328ක් සහ රු.402,364,275ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වර්ෂය තුළ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා ගිණුම්ගත කළ ද, එම අගයන් වර්ෂ ආරම්භක ශේෂයට එකතු වී ඇති බව දන්වා තිබුණු අතර, එලෙස සමහර ගනුදෙනු CIGAS පද්ධතිය ලබාගන්නා ආකාරය දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර බව ද දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.
(ii)	සමාලෝචිත වර්ෂයේදී ACA -2 (ii)හි මූලධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා දරන ලද වියදම රු.529,019,190ක් වන අතර, ACA 6	2024 වර්ෂය තුළ අත්පත්කර ගන්නා ලද වත්කම්වලින් රු.466,900,603ක් වටිනා වත්කම් පරිගණක පද්ධතිය මගින් ආරම්භක ශේෂයට ගළපා ඇති	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.

	ආකෘතිය අනුව වර්ෂය තුළ වත්කම් මිලදීගැනීම සඳහා දරන ලද වියදම රු.83,818,587ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් අත්පත්කර ගැනීමට දරන ලද වියදමෙහි රු.445,200,603ක වෙනසක් පැවතුණි.	අතර, දෙපාර්තමේන්තුව විසින් අත්පත්කර ගන්නා ලද රු.83,818,587ක් පමණ වර්ෂය තුළ එකතුවීම් ලෙස ACA-6 ආකෘතියෙහි සටහන් වී ඇතිබව දන්වා තිබුණි.	
(iii)	සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය, වත්කම්වල වටිනාකමෙන් ඉවත්කර නොතිබීම නිසා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය අවසාන දේපළ පිරියත හා උපකරණ ශේෂයෙහි හා දේපළ පිරියත හා උපකරණ සංචිතයෙහි නිවැරදි අගය පෙන්නුම් නොකෙරිණි.	ගබඩා අංශයේ නිලධාරින් හිඟවීම හේතුවෙන් යම් කාලප්‍රමාදයකින් යුතුව භාණ්ඩ අපහරණ කිරීම් කටයුතු සිදුකරන ලද අතර, එලෙස අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්වල ශේෂ වත්කම් ලේඛනවලින් ඉවත් කිරීමේ කටයුතු 2025 වර්ෂයේ මැයි මසදී සිදුකරනු ලබන බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.

(ඊ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් වැය ශීර්ෂය 253 (253-1-2-4-1502-12) වෙනුවෙන් දරන ලද රු.190,730ක මුදල අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි (ACA-7) අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් දරන ලද වියදම්වලට ඇතුළත්කර නොතිබුණි.	විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ නිරවුල් කරන ලද අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂය වන රු.190,730ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද රු.15,500,691ක වටිනාකම තුළ අන්තර්ගත වන නිසා අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ පෙන්නුම් කිරීම අවශ්‍ය නොවන බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වගබලා ගත යුතු ය.

(උ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ඇප ලේඛනය**		
	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙලකර නොතිබුණි.	රජයේ නිලධාරින්ගේ ඇපතැබීමේ ආඥා පනත සංශෝධනය සඳහා ඉදිරිපත් වී ඇති බැවින්, ඉදිරියේ දී එම පනතට අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම.

(ii) හානි පිළිබඳ ලේඛනය

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනකර නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව සහ ලබාදී ඇති උපදෙස් අනුව හානි සහ පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 110හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම.

(iii) වාහන ලොග් පොත

මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීනකර පවත්වා නොතිබුණි.	මේ සම්බන්ධයෙන් වාහන විෂයය භාර නිලධාරි වෙත උපදෙස් දී ඇතත්, කාර්යබහුලත්වය මත මෙතෙක් අදාළ පරිදි ලොග් පොත් යාවත්කාලීනකර නොමැති අතර, 2025 මාර්තු 31 දිනට පෙර සියලුම ලොග් පොත් නිසිපරිදි යාවත්කාලීනකර, ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි 1645(අ)හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වාගත යුතු වීම.

(iv) කමිටු රැස්වීම් වාර්තා

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල රැස්වීම් වාර්තා පවත්වා නොතිබුණි.	ඉදිරියේදී ප්‍රසම්පාදන අත්පොතේ 2.11.3 හා ප්‍රසම්පාදන නිර්දේශ සංග්‍රහයෙහි 2.11.3(අ) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අදාළ ආකෘතිය මගින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අත්පොතෙහි2.11.3හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්තා පවත්වාගත යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයන් 13ක් සඳහා වෙන්කරන ලද රු.223,724,435ක ප්‍රතිපාදන ඉතිරි වී	ප්‍රධාන වශයෙන් ප්‍රසම්පාදන කටයුතු කරන අවස්ථාවේදී මිලගණන් පහළ යාම, තරඟකාරී ලංසු කැඳවීම, විදේශ	අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන සැලසුම් සකස්කිරීමට කටයුතු

	තිබූ අතර, වැය විෂයන්වල එසේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 10 සිට සියයට 57 අතර පරාසයක් ගෙන තිබුණි.	විනිමය අඩු අගයක් ගැනීම, නිලධාරී පුරප්පාඩු පැවතීම හා රේගු ගාස්තු පිළිබඳ පුරෝකතනයක් කිරීමට නොහැකිවීම යන කරුණුමත ප්‍රතිපාදනවලට අදාළ ඉතිරිවීම් සිදු වූ බව දන්වා තිබුණි.	කළ යුතු ය.
(ආ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව මුදල් වර්ෂය තුළ තම දෙපාර්තමේන්තුවට ඉටුකළ හැකි ශක්තිය ඇතුළත, සහේතුකව පූර්වානුමාන කළ හැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත්කර ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනස ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට (44) සිට සියයට 140 දක්වා පරාසයක පැවතුණි.	ඉල්ලුම් කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම ලබානොදීම, විනිමය අනුපාත වෙනස්වීම් සහ අමුද්‍රව්‍ය මිල පහත වැටීම් යනාදී කාරණා මත ඇස්තමේන්තු කළ මුදල වියදම් නොවීම හා අත්‍යාවශ්‍ය විද්‍යාගාර උපකරණ කිහිපයක් මිලදීගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන මාරුකිරීම නිසා මූලික ඇස්තමේන්තුව සත්‍ය ඇස්තමේන්තුවෙන් වෙනස් විය. ඇස්තමේන්තු සකස්කරන අවස්ථාව වනවිට සත්‍ය වශයෙන්ම ඇස්තමේන්තු කළ නොහැකි කාරණා හා වර්ෂය තුළදී විධායක දීමනා, ජීවන වියදම් දීමනාව ඉහළ යාම නිසා වැය විෂයන් කිහිපයක් සඳහා පරිපූරක ප්‍රතිපාදන සලසාගැනීමට සිදු වූ නිසා ද මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන මුළු ශුද්ධ ඇස්තමේන්තු ප්‍රතිපාදන අතර වෙනස්කම් නිරූපනය වූ බව දන්වා තිබුණි.	තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ඇ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් අයවැය ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙලකර, සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමනාකරණයකර ගැනීමට කටයුතු කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 16ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන්ට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් අරමුණු සඳහා වෙන්කළ රු.115,036,000ක ප්‍රතිපාදන මාරුකර තිබූ අතර, වැය විෂයන් 4ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.108,835,000ක් ලබාගෙන තිබුණි. වැය විෂයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 5 සිට සියයට 140 අතර පරාසයක් ගෙන තිබුණි.	ඉල්ලුම් කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයට භාණ්ඩාගාරය විසින් ලබානොදීම, දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර විනිමය අනුපාත වෙනස්වීම්, අමුද්‍රව්‍ය මිල පහත වැටීම් යනාදී කාරණා මත ඇස්තමේන්තු කළ වියදම් නොවීම නිසා හා අත්‍යාවශය විද්‍යාගාර උපකරණ කිහිපයක් මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන මාරුකිරීම සිදුවීම නිසා මූලික ඇස්තමේන්තුව ඇස්තමේන්තුවෙන් වෙනස් වේ. තව ද, ඇස්තමේන්තු සකස්කරන අවස්ථාව වන විට සත්‍ය වශයෙන්ම ඇස්තමේන්තු කළ නොහැකි කාරණා හා වර්ෂය තුළදී විධායක දීමනා, ජීවන වියදම් දීමනාව ඉහළ යාම නිසා වැය විෂයයන් කිහිපයක් සඳහා මුදල් රෙගුලාසි 66 හා පරිපූරක ප්‍රතිපාදන සලසාගැනීමට සිදු වූ බව පෙන්වා දෙමි.	තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.

(ඈ)	සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 5ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.10,500,000ක් මාරුකර තිබූ අතර, එලෙස මාරුකරගත් ප්‍රතිපාදන උපයෝජනය නොකර රු.2,634,639ක් එනම් සියයට 11 සිට සියයට 60 දක්වා ඉතිරි වී තිබුණි.	අදාළ බිල්පත් අක්මුදල් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලසීමාවක් තුළ ඉදිරිපත් නොකිරීම, හදිසි අවශ්‍යතා සපුරා ගැනීමට ලබාගත් ප්‍රතිපාදනවලින් ඉතිරිවීම සහ රේගු ගාස්තු පිළිබඳ පුරෝකතනයක් කිරීමට නොහැකිවීම යන කරුණු මත මෙම මුදල් ඉතිරිවූ බව දන්වා තිබුණි.	ඇස්තමේන්තු සකස්කිරීමේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඉ)	සමාලෝචිත වර්ෂයෙහි 233-1-1-1-2103(17) යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම මඟින් ලබාගත් ප්‍රතිපාදන රු.70,000,000න් උපයෝජනය නොකර රු. 15,292,908ක් එනම් සියයට 22ක් ඉතිරි වී තිබුණි.	KOICA ව්‍යාපෘතිය යටතේ ලැබුණු විද්‍යාගාර ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණත්, විද්‍යාගාර යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවලට ආශ්‍රිත දේශීය ගාස්තු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම සඳහා මෙම ප්‍රතිපාදන ලබාගත් අතර, එම දෙපාර්තමේන්තුවලට අදාළ ගාස්තු පුරෝකතනය කළ නොහැකිවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිවූ බව දන්වා තිබුණි.	ඇස්තමේන්තු නිසියාකාරයෙන් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) තුළ බැරකම් ලෙස රු.3,396,209ක් සඳහන්කර තිබුණ ද, ආයතනයේ බැරකම් ලේඛනයෙහි එම අගය රු.3,506,872ක් විය. ඒ අනුව, බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) තුළ බැරකම් රු.110,663ක් අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයට අදාළ බැරකම් ලේඛනය සකස්කර විගණනයට ඉදිරිපත් කරන අවස්ථාව වනවිටත් මෙම ගෙවීම්වලට අදාළ වවුචර් ගිණුම් අංශය වෙත ලැබී නොතිබුණු අතර, ඒ අනුව මාර්තු මාසයේදී ලැබුණු වවුචර් දෙක බැරකම් ලේඛනයට ඇතුළත්ව නොමැතිබව දන්වා තිබුණි.	සියලුම බැරකම් ලේඛනයේ ඇතුළත් කළ යුතු ය.
(ආ)	අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදයට අනුව බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි යාවත්කාලීනකර ඇති සිගාස් ගිණුම්කරණ පද්ධතියට බැඳීම් හා බැරකම්වලට අදාළ ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් ඇතුළත් කළ යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i)හි	**CIGAS** පරිගණක පද්ධතියට බැරකම් ඇතුළත් කිරීමේදී වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතුළත් කළ නොහැකි අතර, ඒ අනුව දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මුදල් රෙගුලාසි 94(2) අනුව ඇති ප්‍රතිපාදන මත බැරකම්වලට එළඹෙන ලදී. ඒ අනුව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වල ඇතුළත් කරන ලද බැරකම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශන (i)හි සත්‍ය වශයෙන්ම ඇති බැරකම් අතර මෙම	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව බැරකම් සම්බන්ධව කටයුතු කළ යුතු ය.

	රු.3,396,209කබැරකම්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන්(SA 92) තුළ ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා බැරකම් ප්‍රකාශනය අතර රු.3,396,209ක වෙනසක් පැවතුණි.	වෙනස දක්නට ඇතිබව දන්වා තිබුණි.	
(ඇ)	සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) තුළ ඇතුළත් නොවූ රු.7,264,125ක් වූ බැරකම් 2025 වර්ෂයේදී නිරවුල්කර තිබුණි.	භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වලට ඇතුළත් වීම සඳහා අදාළ බැරකම්, **cigas** පද්ධතියට ගිණුම්ගත කර තිබිය යුතු වුවත්, 2024 වර්ෂයට ඉතිරි වූ ප්‍රතිපාදන එලෙස බැරකම් ගිණුම්ගත කිරිමට ප්‍රමාණවත් නොවූ නිසා **CIGAS** පද්ධතියට ගිණුම්ගතකර නොමැති බව දන්වා තිබුණි.	වර්ෂයට අදාළ සියලුම බැරකම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු ය.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතුකර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්**,** එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්**,** එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර දැනට පුරප්පාඩු වී ඇති අතර, අභ්‍යන්තර විගණන කටයුතු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළින් ආවරණය කරනු ලබන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ආ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්**,** වාර්තාවේ 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර දැනට පුරප්පාඩු වී ඇති අතර, අභ්‍යන්තර විගණන කටයුතු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළින් ආවරණය කරනු ලබන බව දන්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය		**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
නීතිරීති හා රෙගුලාසි වලට යොමුව	**අනුකූල නොවීම**		
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
XV පරිච්ඡේදයෙහි 10.3 වගන්තිය	වැටුප් සහිත විදේශ නිවාඩු ලබාදීමේදී රටින් බැහැරවීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය, අඩුම වශයෙන් නිලධාරියා රටින් පිටවීමට දින 10කට කලින් ඉදිරිපත් කළ යුතු වුව ද, 2024 සැප්තැම්බර් 20 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා කාලපරිච්ඡේදය සඳහා පශ්චාත් උපාධිය හැදෑරීමට වැටුප් සහිත නිවාඩු ලබාගත් ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරියකට සමාලෝචිත වර්ෂය තුළදී අදාළ නිවාඩු අනුමතකර ගැනීමට නොහැකි වී තිබුණි.	දෙපාර්තමේන්තුවේ විෂය භාර නිලධාරිනියගේ ප්‍රමාදය සම්බන්ධයෙන් අවවාද කළ අතර, කඩිනමින් එම නිවාඩුව අනුමතකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	විදේශ නිවාඩු ලබාගැනීමේදී පූර්ව අනුමැතිය ලබාගත යුතු ය.
(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ			
2010 ජූලි මස 09 දිනැති අංක CA/1/1/16/1 දරන හා 1993 දෙසැම්බර් 31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුවේ නිලධාරින් පස්දෙනෙකු විසින් චක්‍රලේඛය පරිදි විදේශ ගමන් පිළිබඳව වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.	නිලධාරිනියන් වෙත ලිඛිතව දන්වා 2025 මාර්තු 31 දිනට පෙර එම වාර්තා ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			

(i)	මු.රෙ. 104(1) (අ)	පාඩුවක් හෝ අලාභයක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහන හයකට අදාළව සිදු වී තිබුණු හදිසි අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබුණි.	මේ වන විට විගණන කටයුතු සඳහා ජාතික විගණන කාර්යාලය වෙත භාරදී ඇති ලිපිගොනු ආපසු ලබාගෙන පරීක්ෂා කිරීමෙන් පසු, එක් එක් අනතුරට අදාළ මූලික පරීක්ෂණ පැවැත්වීමට ප්‍රමාද වූ හේතු වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	වාහන අනතුරු සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ii)	මු.රෙ. 104(2)	පාඩුවෙහි වටිනාකම රු.50,000ට වැඩිනම් එම වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයට (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට) යැවිය යුතු වුව ද, දෙපාර්තමේන්තුව සතු වාහන 07කට අදාළව සිදු වී තිබූ හදිසි අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණු අතර, සිදු වූ හානියේ වටිනාකම හෝ රක්ෂණ සමාගම විසින් ගෙවන ලද මුදල පිළිබඳ තොරතුරු අදාළ ලිපිගොනුව තුළ නොතිබුණි.	2024 වර්ෂයේ සිදු වූ වාහන අනතුරුවල රක්ෂණ හිමිකම්, අදාළ රක්ෂණ සමාගම් විසින් සම්පූර්ණයෙන් පියවා ඇති අතර, ඒ අනුව අදාළ ලිපිගොනු යාවත්කාලීන කර, මුදල් රෙගුලාසි 104/(2) ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(iii)	මු.රෙ. 115	පසුගිය වර්ෂවලට අදාළ ගෙවීම් කිරීම් සඳහා මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව අනුමැතිය ලබා ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ සේවා සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ඒ ඒ වර්ෂවල ලද වහාම රජයේ ආදායමට බැරකර තිබුණ ද, එයින් නිලධාරීන්ට අදාළ දීමනාව ගෙවීමේදී පසුගිය වර්ෂවලට අදාළ මුදල් ද සමාලෝචිත වර්ෂයේදී අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.	අදාළ ආදායම රැස්කරන අවස්ථාවේදී රජයේ ආදායමට බැරකරනු ලබන අතර, අදාළ විද්‍යාගාර මගින් එක් එක් නිලධාරියාට ගෙවනු ලබන ගාස්තු සැකසීම සිදුකරනු ලබයි. ඒ අනුව ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදනය ප්‍රමාණයම භාණ්ඩාගාරය විසින් ලබා නොදීම නිසා දීර්ඝ කාලයක් තිස්සේ එක් වී ඇති ගෙවිය යුතු ආදායම් ලැබෙන ප්‍රතිපාදන මත පැරණි	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

		ගෙවීම් වලට ප්‍රමුඛතාවය ලබාදී අදාළ ගෙවීම් සිදුකරනු ලබන බවත්, සත්‍ය වශයෙන්ම නිලධාරින්හට ගෙවනු ලබන්නේ රැස්කරන ලද ආදායම නිසා මෙතෙක් කිසිදු අවස්ථාවක මෙම ගෙවීම් සඳහා මු.රෙ.115 අනුව අනුමැතිය ලබානොගත් බවත් දන්වා තිබුණි.	
(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
(i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ වාහන 22කට අදාළව එසේකර නොතිබුණි.	මේ වන විට දෙපාර්තමේන්තුව සතු වාහනවලට අදාළව ඉන්ධන පරීක්ෂාව සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම්කර ඇතිබව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ii) 2024 ජුනි 07 දිනැති අංක 14/2022 (IV) දරන චක්‍රලේඛයේ 2.9 ඡේදය	රාජ්‍ය නිලධාරින්ට වැටුප් රහිත දේශීය/විදේශීය නිවාඩු ලබාදීමේදී අදාළ අයදුම්පත්‍රය නිවාඩුව ආරම්භ වන දිනට අවම මාස තුනකට පෙර කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් දෙදෙනෙකු විසින් නිවාඩු ආරම්භවීමට සති දෙකකට පෙර නිවාඩු ඉල්ලුම්කර තිබුණි.	මෙම නිලධාරිනියන් දෙදෙනා වීසා අපේක්ෂාවෙන් සිටි නමුත්, වීසා ලැබීම අවිනිශ්චිත වූ නිසා වීසා අනුමත වනතුරු නිවාඩු අයදුම්පත් ඉදිරිපත් කර නොමැති අතර, වීසා ලැබීමෙන් පසුව නිවාඩු ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව නිලධාරිනියන් දෙදෙනාගේ අනාගත අභිවෘද්ධිය සළකා කඩිනමින් නිවාඩු අනුමතකර දීමට කටයුතු කළ බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ඉ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

2016 අගෝස්තු 02 දිනැති අංක PF/R/04/08/01(13) දරන ලිපිය	දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ නිලධාරින් සිය සේවා කාලයෙන් පරිබාහිරව ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් ලබාගන්නා ගාස්තුව, වසර 03කට වරක් සමාලෝචනය කර නිසිපරිදි සංශෝධනය කිරීමට පියවර ගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ අනුමතකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයම සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගෙන තිබුණි.	ගාස්තු සමාලෝචනය සඳහා ඉල්ලීමක් ජේෂ්ඨ අමාත්‍යාංශය හරහා මහභාණ්ඩාගාරය වෙත 2024 දෙසැම්බර් 06 දින ඉදිරිපත් කර ඇති නමුත්, ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ඊ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛයේ 7 ඡේදය	එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	ගබඩා අංශයෙහි නිලධාරින් නොමැතිවීම හේතුවෙන් කාල ප්‍රමාදයකින් යුතුව භාණ්ඩ අපහරණය කිරීම් කටයුතු සිදුකළ ද, අපහරණය කරන ලද වත්කම්වල වටිනාකම ගිණුම් ගතකිරීම 2024 වර්ෂයේදී සිදුනොවූ නිසා කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද්දේ ගිණුම්වල සත්‍ය වශයෙන්ම පැවති තොරතුරු බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.5 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන තැන්පතු (අංක 11-604) ලෙස තැන්පත් කරන ලද රු.58,366,386ක් තැන්පතු ලෙජරයේ සටහන්කර නොතිබුණි.	2024 වර්ෂයට අදාළව ප්‍රතිපාදන තැන්පතු ගිණුමට (11 – 604) රු.58,366,385ක් මාරුකිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2025 වර්ෂයේ පෙබරවාරි මාසයේදී ලැබුණු අතර, ඒ	නිවැරදි වටිනාකම් පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

අනුව එම වටිනාකම 2025 වර්ෂයේ ආරම්භ ශේෂයක් ලෙස තැන්පතු ලෙජරයේ සටහන් කළ බව දන්වා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය තුළදී සංශෝධනයකර තිබුණ ද, ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද නමුත් අනුමැතිය මෙතෙක් ලැබී නොමැති බව දන්වා තිබුණි.	සංශෝධන සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12(අ) ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වී නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවය කරන කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර සකස්කර ඇති බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය.
(ඇ)	දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා විශේෂඥ දීමනා ලැබීම් ලෙස රුපියල් මිලියන 20ක් ඇස්තමේන්තුකර තිබූ අතර, සත්‍ය වශයෙන් රුපියල් මිලියන 34ක් ලැබී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුව නිසියාකාරව පිළියෙල නොකිරීම හේතුවෙන් සත්‍ය ලැබීම් සියයට 170කින් වැඩි වී තිබුණි.	දෙපාර්තමේන්තුව වෙත පෞද්ගලික පාර්ශ්වයන්ගෙන් විශ්ලේෂණ සඳහා ලැබෙන ඉල්ලීම් එම පාර්ශ්වයන්ගේ අවශ්‍යතාවය මත තීරණය වන බැවින් නිශ්චිතව පුරෝකථනය කළ නොහැකි බව දන්වා තිබුණි.	ඇස්තමේන්තු නිසියාකාරව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය ආරම්භයේදී දෙපාර්තමේන්තුවේ අධිකරණ විද්‍යා අංශයට හා ආහාර විද්‍යා අංශයට පරීක්ෂණයට භාජනයකර විශ්ලේෂණ වාර්තා නිකුත්කිරීම සඳහා පිළිවෙළින් නඩුභාණ්ඩ 16,237ක් සහ 1,585ක් තිබුණු අතර, වර්ෂය තුළදී පිළිවෙළින්	ඉදිරිපත්ව තිබූ සමස්ථ නඩුභාණ්ඩ ප්‍රමාණයෙන් සියයට 64කට ආසන්න ප්‍රමාණයක් වර්ෂය තුළදී විශ්ලේෂණය නිමකර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලයෙන් 1/3කට ආසන්න තනතුරු සංඛ්‍යාවන් පුරප්පාඩු වී ඇති බවත්, ඒ අනුව එවැනි තනතුරු	කාර්යමණ්ඩල ගැටලු විසඳාගෙන මෙම නිමවුම් මට්ටම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු ය.

	නඩුභාණ්ඩ 44, 172ක් සහ 20,352ක් ලැබී තිබුණි. මින් වර්ෂය තුළදී අධිකරණ විද්‍යා අංශය විසින් නඩුභාණ්ඩ 33,446ක් ද, ආහාර විද්‍යා අංශය නඩුභාණ්ඩ 18,680ක් ද, විශ්ලේෂණයකර වාර්තා ඉදිරිපත්කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට අධිකරණ විද්‍යා අංශයට හා ආහාර විද්‍යා අංශයට පිළිවෙළින් නඩුභාණ්ඩ 26,963ක් සහ 3,257ක්, එනම් සියයට 45ක් සහ සියයට 15ක් විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කිරීමට ඉතිරි වී තිබුණි.	සංඛ්‍යාවක් පුරප්පාඩු වී තිබියදී කාර්යසාධනය ඉහළ නංවා ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර වන බවත්, කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ වන්නේ නම් ඉහළ කාර්යසාධනයක් සපුරාගත හැකි බවත් දන්වා තිබුණි.	
(ආ)	විශ්ලේෂණයකර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩුභාණ්ඩ 30,220න් නඩුභාණ්ඩ 4,028ක් එනම් සියයට 13ක් 2017-2023 කාලපරිච්ඡේදයට අදාළ පැවතුණි.	ප්‍රමාණවත් පරිදි නඩුභාණ්ඩ ඉදිරිපත් කර නොතිබීම සහ විශ්ලේෂණය සඳහා අලුතින් විශ්ලේෂණ ක්‍රම සකස්කිරීමට සිදුවීම නිසා, ඉතිරිව ඇති නඩුභාණ්ඩ හැකි ඉක්මනින් විශ්ලේෂණයකර අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට විද්‍යාගාර ප්‍රධානීන්හට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි.	පැරණි නඩු ප්‍රමාණය ඉක්මනින් විසඳා ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව වාහන මිලදීගැනීමට රු.2,000,000ක් වෙන්කර තිබුණ ද, වර්ෂය තුළදී රු.1,052,139ක් පමණක් වැයකර තිබූ අතර, ඒ අනුව සියයට 47ක් ඇස්තමේන්තු මුදලින් ඉතිරි වී තිබුණි.	2024 වර්ෂය සඳහා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදීගැනීම වෙනුවෙන් රු.1,843,578ක් වැයකර ඇති අතර, ඒ අනුව ඉතිරිවීමේ ප්‍රතිශතය සියයට 7ක් බව දන්වා තිබුණි.	ඇස්තමේන්තු නිසියාකාරව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා රු.100,000,000ක් ඇස්තමේන්තුකර තිබූ අතර, වර්ෂය තුළදී මින් රු.42,836,328ක මුදලක් වැයකර තිබූ අතර, ඒ අනුව සියයට 57ක මුදලක් ඉතිරිවී තිබුණි.	KOICA ව්‍යාපෘතියට අදාළව ධූලක විද්‍යාගාරය හා මත්ද්‍රව්‍ය විද්‍යාගාරය නවීකරණය කිරීම සඳහා මෙම ප්‍රතිපාදනය ඉල්ලුම් කළ නමුත්, වාර්ෂික ඇස්තමේන්තු සකස්කරන අවස්ථාව වන විට එම ඉදිකිරීමට අදාළව දළ ඇස්තමේන්තුවක් හෝ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර නොතිබූ නිසා මෙලෙස වියදම පුරෝකථනය කොට ප්‍රතිපාදන ඉල්ලුම් කළ බව දන්වා තිබුණි.	ඇස්තමේන්තු නිසියාකාරව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයෙහි 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරුවක් සිදුකළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කිරීමට කටයුතුකර නොතිබුණි.	2024 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම සඳහා ඉල්ලීමක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ ද, පළමු වටයේ තක්සේරු කිරීම් නිමවන තෙක් දෙවෙනි වටයේ ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. තව ද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ නැවත තක්සේරුව සඳහා කමිටු 2ක් 2024 වර්ෂයේදී පත්කරන ලද නමුත්, මේ වන තෙක් එම තක්සේරුව අවසන් කර නොමැති බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතු ය.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳව 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වග බලාගැනීම කළ යුතු යැයි සඳහන්කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.	රජයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ ආඥා පනත සංශෝධනය සඳහා ඉදිරිපත් වී ඇති බැවින්, ඉදිරියේදී එම පනතට අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2003 පෙබරවාරි 14 දින සිදු වූ ගිනි අනතුරු අලාභය රු.2,229,111ක් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, එය පොත්වලින් කපාහැරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතුකර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	අදාළ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව සතු මෝටර් වාහන 7ක අනතුරුවලට අදාළ අලුත්වැඩියා කටයුතු රක්ෂණාවරණය යටතේ සිදුකිරීමට අයදුම්පත් යොමුකර තිබුණ ද, මෙම අලුත්වැඩියාවන් නියම වශයෙන් සිදුකළ බව, රක්ෂණ සමාගම විසින් අදාළ සම්පූර්ණ වටිනාකම ගෙවූ බව හෝ අනතුරට අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් යම් මුදලක් අයකර ගත යුතු ද නැද්ද යන්න පිළිබඳ කිසිදු තොරතුරක් වාහන අනතුරු ලිපිගොනු තුළ ඇතුළත්කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අදාළ කමිටු වාර්තා ලබාගැනීමට කටයුතුකර ඇති අතර, එලෙස ලැබෙන වාර්තා අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා තිබුණි.	අදාළ තොරතුරු ලිපිගොනුවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2022 වර්ෂයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.85,861ක ආපදා ණයශේෂය, වැඩ තහනම්කර ඇති නිලධාරිනියකගෙන් වසර 10කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.18,754ක ආපදා ණයශේෂය සහ නිලධාරියෙකුගෙන් වසර 03කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු රු.2,400ක විශේෂ අත්තිකාරම් ණයශේෂය සහ2023 ජූලි මස 06 දින සිට සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.222,950ක ආපදා ණයශේෂය හා රු.7,500ක උත්සව අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	ස්ථාන මාරු වී ගිය නිලධාරියාගෙන් අයවිය යුතු ණයශේෂය 2025 අප්‍රේල් මාසය වන තෙක් වැටුපෙන් වාරික වශයෙන් අඩුකළ අතර, 2025 මැයි මාසයේදී ආපදා ණයසීමාව රු.400,000ක් දක්වා ඉහළ නංවා ඇති බැවින්, 2025 මැයි මාසයේදී සම්පූර්ණ ණයශේෂයට ජ’නල් මගින් අයකර ගැනීමට කටයුතු සලසා ඇති බවත්, අනෙකුත් වැඩ තහනම්කර ඇති හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ ණයශේෂ නිරවුල් කරන ලෙස එම නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා තිබුණි.	අයවිය යුතු ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඇ)	2016 වර්ෂයේදී KOICA ප්‍රදානයක් ලෙස දෙපාර්තමේන්තුවට ලැබී තිබූ IBM Storwize V3700 වර්ගයේ උපකරණය තුළ 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය මගින් නිකුත්කර ඇති පරීක්ෂණ වාර්තාවලට අදාළ දත්ත ගබඩාකර තිබුණි. මෙම උපකරණය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේදී ක්‍රියා විරහිත වී තිබූ අතර, මේ හේතුවෙන් මෙම Storage Server උපකරණය තුළ ගබඩාකර තිබූ දත්ත නැවත ලබාගැනීමට නොහැකි තත්ත්වයක් මතුවී ඇති අතර, එම උපකරණය වර්ෂය තුළදී නැවත අලුත්වැඩියාකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	මෙම උපකරණය 2024 වර්ෂයේදී ක්‍රියා විරහිත වූ අතර, නියෝජිත ආයතනය විසින් එම අලුත්වැඩියාව සිදුකළ නොහැකි බව දන්වන ලදී. මේ සඳහා තරඟකාරී ලංසු කැඳවීම මගින් ලංසු කැඳවන ලද අතර, එක් ආයතනයක් විසින් පමණක් එම යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට ගත හැකි ද යන්න සලකා බැලීම සඳහා අවශ්‍ය උපකරණයක් මිලදීගැනීමට මිලගණන් ඉදිරිපත් කරන ලද අතර, එම ආයතනය දැනට අදාළ අලුත්වැඩියාවේ මූලික කටයුතු ආරම්භකර ඇති බව දන්වා තිබුණි.	උපකරණය අලුත්වැඩියාකර දත්ත කඩිනමින් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවට අදාළ තිරසාර සංවර්ධන අරමුණක් හා ඒ සඳහා ඉලක්කයන් ද හඳුනාගෙන තිබූ අතර, එම ඉලක්ක ළඟාකර ගැනීමට දර්ශක පිළියෙළ කර තිබුණි. එහිදී තිරසාර සංවර්ධන ඉලක්කයන් ලඟා කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ අරමුණ වූ “සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතනයන් බිහිකිරීමේ” කර්තව්‍යයේදී ඍජුව දායක වන ඉලක්කය ලෙස සාමකාමී හා සියළුදෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීමේ කාර්යයට සම්බන්ධ වන ප්‍රධාන කාර්යයක් ලෙස ආයතනය විසින් ඉටු කරනු ලබන විශ්ලේෂණය සඳහා ලැබී ඇති නඩු භාණ්ඩ හා නියැදි පරීක්ෂණය තුළින් වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ඉලක්කගතව ක්‍රියාත්මක විය යුතු නමුත්, ප්‍රවර්තන වර්ෂයේ දී වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩු භාණ්ඩ 30,220න් නඩුභාණ්ඩ 4,028ක් එනම් සියයට 13ක් 2017-2023 කාලපරිච්ඡේදයට අදාළව තිබූ බව නිරීක්ෂණය විය.	සංවර්ධන ඉලක්ක සියල්ලම සකස්කර තිබුණේ දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය තුළින් සපුරාගත හැකිවන පරිදි බවත්, ඒ අනුව අපේක්ෂිත ඉලක්ක සපුරාගෙන ඇති බවත්, කෙසේ වුව ද කාර්යමණ්ඩලයේ තනතුරු විශාල සංඛ්‍යාවක් පුරප්පාඩුව තිබීමත්, ප්‍රමාණවත් පරිදි නඩුභාණ්ඩ ඉදිරිපත්කර නොතිබීම සහ විශ්ලේෂණය සඳහා අලුතින් විශ්ලේෂණ ක්‍රම සකස්කිරීමට සිදුවීම නිසාත්, සංවර්ධන ඉලක්ක ඉහළ අගයක් තුළ පිහිටුවා ගත නොහැකි වූ බව දන්වා තිබුණි.	තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට කටයුතු කළ යුතු ය.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව පිළිබඳව තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබාගැනීමට වෙබ් අඩවියක් නිර්මාණයකර තිබුණ ද, එය සමාලෝචිත වර්ෂය තුළ දී යාවත්කාලීනකර නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු මේ වන විට නිමකර ඇති අතර, 2025 ජූනි මස ආරම්භයේ සිට වෙබ් අඩවිය නැවත ක්‍රියාත්මක තත්ත්වයට ගත හැකි බව දන්වා තිබුණි.	වෙබ් අඩවිය යාවත්කාලීනකර ගැනීමට කටයුතු කළ යුතු ය.

6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.	අභ්‍යන්තර විගණන තනතුරක් කාර්යමණ්ඩලය තුළ අනුමත වී ඇතත්, වර්ෂ ගණනාවක් තිස්සේ අදාළ තනතුර සඳහා නිලධාරියෙකු මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්තකර නොමැති අතර, අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව දන්වා තිබුණි.	විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතු ය.

7. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට උපකාරී වන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 33කගේ, තෘතියික මට්ටමේ නිලධාරීන් 6කගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන්, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන නඩුභාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත්කරන විද්‍යාත්මක වාර්තා මාස තුනක කාලයක් ඇතුළත ලබාදීමට බාධාවක් වී තිබුණි.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 33, ගණකාධිකාරී සහ යතුරු ලේඛක පුරප්පාඩු සඳහා බඳවාගැනීමට රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර, රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී තනතුර සඳහා 2025 මැයි 17 දින විභාග පවත්වා ප්‍රතිඵල ලැබීමෙන් පසු බඳවාගැනීමටත්,	ආයතනයේ අරමුණු සහ ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා තනතුරුවලට අදාළ කාර්යමණ්ඩලය බඳවාගැනීමට කටයුතු කළ යුතු ය.

රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරී විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු 05 සම්පූර්ණ කිරීම සඳහා දැනට සේවයේ නියුතු කිසිදු රසායනාගාර තාක්ෂණ සේවා නිලධාරියෙකු සුදුසුකම් සපුරා නොමැති බවත්, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බඳවාගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙත දන්වා ඇති බවත්, දන්වා තිබුණි.